# "සොබා චලන සිතුවම්" කෙටි චිත්‍රපට තරඟාවලිය



2017 ජුනි 05 වන දිනට යෙදෙන ජගත් පරිසර දිනය නිමිත්තෙන් දීපව්‍යාප්ත කෙටි චිත්‍රපට තරඟාවලියක් සංවිධානය කිරීමට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය තීරණය කර ඇත. මේ සඳහා උනන්දුවක් දක්වන සියලුම සිනමාකරුවන්ට ඇරයුම් කෙරේ.

**තරඟ කොන්දේසි**

**කාලය** උපරිම විනාඩි පහකි (05)

**තේමාව** පරිසරය පිළිබඳ ඕනෑම තේමාවක් ඔස්සේ නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.

**තරඟ අංශ** ප්‍රබන්ධ, වාර්තාමය සහ සජීවිකරණ

**භාෂා මාධ්‍ය** සිංහල, දෙමළ, ඉංග්‍රීසි

සිංහල, දෙමළ භාෂාවලින් සිදු කරන නිර්මාණ සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් උපසිරැසි ගැන්විය යුතුය. (දෙබස් රහිත නම් මෙම කොන්දේසිය අදාළ නොවේ).

**තාක්ෂණික පිරිවිතර**

රූගත කිරීම සඳහා සුදුසු ඕනෑම මෙවලමක් භාවිත කළ හැකිය (උදා: ජංගම දුරකතනයක් මගින් රූගත කළ නිර්මාණයක් වුවද ඉදිරිපත් කළ හැකිය). අවසන් නිෂ්පාදනය පුළුල් තිරයකට ප්‍රක්ෂේපණය කිරීමට සුදුසු වන උසස් තීව්‍රතාවයෙන් (Hi Resolution) යුතුවිය යුතුය.

**නිර්මාණ ඉදිරිපත් කිරීම**

එක් අයදුම්කරුවෙකුට නිර්මාණ එකකට වැඩි සංඛ්‍යාවක් වුව ද ඉදිරිපත් කළ හැකි අතර, එක් එක් නිර්මාණයක් දත්ත ගොනුවක් (Data file) ලෙස සංගත තැටියකින් (DVD) පිටපත් දෙකකින් ලබා දිය යුතුය.

**බුද්ධිමය දේපල සම්බන්ධ කොන්දේසි**

ඉදිරිපත් කරන නිර්මාණවල ස්වාධීනභාවය පිළිබඳ පූර්ණ වගකීම නිර්මාණකරු සතුය. නිර්මාණ සඳහා කර්තෘ හිමිකම්වලින් නිදහස් (Royalty Free) හෝ විවෘත අධ්‍යාපනික සම්පත් (OER - Open Educational Resources) වශයෙන් පවත්නා සංගීතය හෝ ශබ්ද පමණක් යොදා ගන්නේ නම් එකී මූලාශ්‍ර චිත්‍රපටය අවසනදී සඳහන් කළ යුතුය.

**අවසන් හිමිකම**

මෙම තරඟයට ඉදිරිපත් කරන චිත්‍රපට සුදුසු අවස්ථාවන්හි ප්‍රදර්ශනය කිරීමේ සහ ප්‍රදර්ශනය සඳහා ආයතන වෙත ලබා දීමේ අයිතිය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට හිමිවේ.

නිර්මාණකරුට තම නිර්මාණයක් වෙනත් තරඟයක් සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව පමණක් එසේ කළ හැකිය.

**වෙනත් කොන්දේසි**

අනන්‍යතාවය තහවුරු කිරීමේදී ඇතිවිය හැකි ගැටලු මගහරවා ගැනීම සඳහා නිර්මාණකරුවන් සිය සැබෑ නමින් පමණක් නිර්මාණ ඉදිරිපත් කළ යුතුය.

වෙනත් අයෙකුගේ නිර්මාණ තම නිර්මාණයක් ලෙසින් ඉදිරිපත් කිරීම තරඟයෙන් ප්‍රතික්ෂේප වීමට හේතුවක් වේ.

තරඟයේ විනිශ්චය අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගෙන් සැදුම්ලත් විනිසුරු මඩුල්ලක් විසින් සිදු කරන අතර, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

**ත්‍යාග**

| | | |
|---|---|---|
| **1** | **වෙනි ස්ථානය** | **රු. 50,000.00** |
| **2** | **වෙනි ස්ථානය** | **රු. 40,000.00** |
| **3** | **වෙනි ස්ථානය** | **රු. 30,000.00** |

සියලු තරඟ අංශ ඇසුරින් තෝරාගන්නා ජයග්‍රාහකයින් පස් දෙනෙකුට කුසලතා හා සමරු තිළිණ පිරිනැමේ. තරඟයට සහභාගී වන සෙසු නිර්මාණකරුවන් හට සහභාගීත්ව සහතිකයක් පිරිනැමීමට නියමිතය.

මුදල් ත්‍යාග මෙන්ම සම්මාන සහ සහතික පත්‍ර ද ජගත් පරිසර දින ජාතික සැමරුම් උත්සවයේදී පිරිනැමීමට අපේක්ෂා කෙරේ.

**නිර්මාණ භාර ගැනීමේ අවසන් දිනය**

2017 මැයි 02

(අයදුම්පත්‍රය ..................................... බාගත කරන්න)

**ලිපිනය**

අධ්‍යක්ෂ, අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ අංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, අංක 82, සම්පත්පාය, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

වැඩිදුර තොරතුරු - 0112 863 652